# 17 පුංචි පැළේ ගස වෙනා



**සාහිත්‍ය නිර්මාණකරණයෙහි ලා ලේඛකයාගේ ළමා වියේ අත්දැකීම් නිසැක ව ම බලපායි. ලෝක ප්‍රකට ශ්‍රේෂ්ඨ සාහිත්‍යධරයන් මෙන් ම විශිෂ්ට ගණයේ ලේඛක චරිත හා ඔවුන්ගේ නිර්මාණ ඇසුරෙන් එය අප කොතෙකුත් අත්දැක ඇත. ඇතැම් ලේඛකයන් තම ළමා වියේ අත්දැකීම් එක් කර සිය චරිතාපදානය ලියා තැබීමට උත්සුක වූයේ ද ඒ නිසා ම විය යුතුය.**

**නූතන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රකට පුරෝගාමී ලේඛකයකු වන කේ. ජයතිලකගේ 'පුංචි පැළේ ගස වෙනා' කෘතිය ස්වයං චරිතාපදානකයැයි කිය හැකි ය. ඒ ඇසුරෙන් මෙම පාඩම සකස් කර ඇත.**

පවුලෙන්, ගම් දොරෙන් මතු නොව පාසැලෙන් හා අධ්‍යාපනයෙන් ද ගුරු භවතුන් හා සම වයස් දරුවන් ඇසුරෙන් ද යමකුගේ සිසු අවධියත් බාල අවධියත් දලු ලා වැඩෙන රඟ අපි කවුරුත් පාහේ දනිමු. කේ. ජයතිලකයන්ට ද එය එසේම වූ අතර ඔහුගේ චරිතයේ මුල් අතු ඉති දලු ලන්නට ගත්තේ රදාවාන පාඨශාලාවේ ඉගෙනුම ලබන අවධියේදී ම ය. "හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ" යන ප්‍රකට ජන කියමන සැබෑ කරමින් අපගේ ප්‍රධාන චරිතයේ පියමං ලකුණු ඒ පාසල් සමයෙන් මතු ව ආ අයුරු පාසැලත්, පාසැලේ දී තමාට මග පෙන් වූ ගුරුභවතුන් හා සමකාලීන මිතුරන් ගැනත් ඔහු කරන මේ සඳහනෙන් කියැවේ.

"ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය යටතේ අපට ගම්මුන්ගේ ගෙවල්වල උළු සෙවිලි කර දීම, කුඹුරු වැඩ කර දීම ආදියෙහි ද යෙදෙන්නට සිදු විය. අප විසින් දුප්පත් පවුල් දෙකකට වැසිකිළි දෙකක් තනා දෙන ලදි. මේ වැඩ, විශේෂයෙන් අනුන්ට වැසිකිළි තැනීම දෙමවුපියන්ගේ තදබල දෝෂාරෝපණයට ලක් විය. එසේ වුවත් ඔවුන් තුළ වූ කිසියම් හික්මීමක් නිසා පාසැල විසින් ගෙන

යන කවර ව්‍යාපාරයකට හෝ සංවිධානය වූ විරෝධයක් නොපාන ලදි. මේ වැඩවල යෙදීම නිසා අපේ ඉගෙනීමට බාධා වූයේ යැයි නොසිතිය යුතු. නියඟකින් වේළී ගිය පෙදෙසක පිහිටි ගොවිපළක් හදිසියේ ලද වර්ෂාවකින් ප්‍රාණවත් ව දලු ලන්නා සේ අපේ ඉගෙනීම ද ප්‍රබෝධවත් විය. මේ පිටිසරබද කුඩා පාසැලින් විවිධ ක්ෂේත්‍රවල දක්ෂතා හිටි අඩියේ මතු වන්නට විය. ගමේ අනුරුවක් ඉස්කෝල වත්ත මැද තැනිණි. ශිෂ්‍යයන් විසින් ම ගබඩා කාමරයක් ගොඩ නැඟිණි. වත්ත පිටිය මල් පලතුරුවලින් ගැවසී ගියේ ය. සිසුහු නාට්‍ය දෙකක් රඟ දැක්වූහ. ඉන් එකක ප්‍රධාන අමුත්තා වූයේ එවක පළාත් පාලන ඇමතිත් පළාතේ මන්ත්‍රීවරයාත් වූ ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ය. මේ පිළිබඳ විස්තර පුවත්පත්වල පළ විය. නාට්‍යයෙන් ලද ලාභයෙන් පාසැලට ගුවන්විදුලි යන්ත්‍රයක් මිල දී ගැනිණි. ළමයි ගුවන්විදුලි ගායනා තරගවලට ඉදිරිපත් වූහ. (මුලින් ම මේ සඳහා ඉදිරිපත් වූයේ ඇම්.ජී. සමරසේකර - පසුව මහගම සේකර - ශිෂ්‍යයා ය.) සේකර ගායකයකු මෙන් ම දක්ෂ නළුවෙක් ද විය. නාට්‍යවල කවටයාගේ චරිතය, රඟපෑවේ ඔහු ය. මම ද එක් නාට්‍යයක රඟපා ඇත්තෙමි. ඒ විජය නාට්‍යයෙහි තාපසයා හැටියට ය. තාපසයකු හැටියට පෙනී සිටීමට මට රඟපෑමක් අවශ්‍ය නොවී ය! මා දකුණත ඔසවා "විජය තොපට ජය වේවා!" කියත් ම විජය ඇතුළු පිරිස මා ඉදිරියේ දණින් වැටී නමස්කාර කරති.

අප කොතරම් කියවීමෙහි ගැලී සිටියත් සාහිත්‍යය පිළිබඳව ක්‍රමානුකූල දැනුමක් හා නියම රුචියක් අප තුළ වගා කරන ලද්දේ ජයසේකර මහතා විසිනි. 'සිංහල රචනය' ආදි පොත් කිහිපයක් ලියා ඇති ගම්හේවා ගුණවර්ධනගේ (අබිරම් ගම්හේවාගේ සොහොයුරු) මිත්‍රයකු වූ ජයසේකර මහතා කුමාරතුංගගේ 'හෙළ' ශෛලියට බර වූවෙක් විය. එවකට සිංහල සාහිත්‍යයෙහි ක්‍රියාත්මකව තිබූ ප්‍රධාන බලවේගය එය ම විය. මෙහෙයින් අප ද ලද්දේ හෙළයට නැඹුරු වූ සාහිත්‍ය රුචියකි.

ඔහු අපට සාහිත්‍යය ඉගැන්වීම ආරම්භ කරන ලද්දේ අටවැනි ප්‍රමාණයේ දී ය. අවුරුදු තුන හතරක් ගත වන කලියෙන් කව්සිළුමිණ දක්වා වූ සෑම පැරණි සිංහල සාහිත්‍ය ග්‍රන්ථයක් ම මා කියවා තිබුණේ යැයි කීම අතිශයෝක්තියක් නොවේ. මේ කාලයේ දී මගේ ස්මරණ ශක්තිය ද අධික විය. ගුත්තිලයෙහි අගය කිසිවකු අපට පෙන්වා දී නොතිබුණු නමුත් එයින් භාගයක් පමණ මට කට පාඩමෙන් කිව හැකි විය. උම්මග්ග ජාතකයේ මුල් පිටු ගණනක් ම මතක තිබිණ. ඩබ්ලියු. ඒ. සිල්වාගේ නවකතාවල සමහර කොටසුත්, ඊ. තෙන්නකෝන්ගේ වවුලුවෙන් විශාල කොටසකුත් එක දිගට ම මතකින් කිව හැකි විය. එපමණක් නොව කුමාරතුංග විවරණ ග්‍රන්ථ මා කියවූයේ නවකතාවක් කියවන

තරමේ ම අභිරුචියකිනි. කුමාරතුංගට සිය බහුශ්‍රැතතාව ඉක්මවා යන නිර්මාණ ශක්තියක් තිබිණි. වචනයක් දෙකක් වෙනස් කොට අනුන්ගේ නීරස කවියකට පවා රස බහා ලීමේ පුදුම ශක්තියක් ඔහුට තිබිණ.

මීට අවුරුදු කිහිපයකට පසු කව්සිළුමිණේ එකද කවියක් වත් තේරුම් ගැනීමට නුපුළුවන් ව සිටි තැනැත්තකුට අවසාන ගුරු විභාගය සඳහා මම එය කියා දුනිමි. ගුරු විභාගයට කව්සිළුමිණ ගැන ඉතා ගැඹුරු දැනීමක් බලාපොරොත්තු වූයේ නැති බව සැබවි. එසේ වුවත් ඔහු ඉන් සමත් වීමෙන් පෙනී යන්නේ ඒ පොත් පිළිබඳ සෑහෙන අවබෝධයක් මට තිබුණු බවයි. මීටත් පසු කාලයෙහි ලන්ඩන් විශ්වවිද්‍යාලයේ සිංහල ගෞරව උපාධියට පෙනී සිටි අවස්ථාවේ දී පවා නියමිත පොත් වරක් කියවූවා විනා විශේෂ අධ්‍යයනයක් නොකෙළෙමි.

ජයසේකර මහතා මට වඩාලාත් අමතක නොවන්නේ අන්‍යතර වූ හේතුවක් නිසා ය. ඔහු සිය ගොවිපළේ සියලු පැළෑටීන්ගෙන් එක ම ප්‍රතිඵල අපේක්ෂා නොකෙළේ ය. ඔහු ඒ එකිනෙකෙන් ගෙඩි, මල්, කරල්, අල, මුල්, ඉදල් ආදි වශයෙන් විවිධ වූ ප්‍රතිඵල බලාපොරොත්තු විය. ඔහු ඒවාට සාත්තු සප්පායම් කළේ ද ඒ අනුව ය. මේ ගොවිපළේ ක්ෂණිකව වැඩුණු උඳු, මුං, මිරිස් අතර මම එසේ ක්ෂණිකව නොවැඩුණු කජු පැළයක් වීමි. මේ උපමාව මසිතට නඟින්නේ ජයසේකර මහතා පැමිණීමට බොහෝ කලකට ඉහත, එනම්; මා පළමු වැනි හෝ දෙවැනි ප්‍රමාණයේ දී උගත් පුංචි කවියක් හේතු කොට ගෙන ය. කුමන කරුණක් නිසා හෝ ඒ කවිය මගේ සිතට ද තදින් කා වැදී ඇත.

පාඨශාලා භූමියේ පිහිටි සෙල්ලම් පිට්ටනියට ඔබ්බෙන් අතු පතර විදහා ගත් විශාල කජු ගසක් විය. මේ ගස යට වූයේ මැටි බිමකි. එහි එකද තණ කොළයක් වත් නොවී ය. ගසෙන් වැටෙන වියළි කජු කොළ ද දිනපතා අහුලා ඉවත දමනු ලැබ පිරිසිදුව පැවැත්තේ ය. පාසැලේ එළිමහන් පන්ති පැවැත්වූයේ මෙතැන ය. අපි ගුරුවරයා වටා වලයාකාර ව සිට ගෙන කවි හා කතන්දර උගතිමු. ඉන් මේ කවිය ඒ කජු ගස ම සංකේත කර තැනුවක් වැනි විය.

පුංචි ඇටේ පැළ වෙනා
පුංචි පැළේ ගස වෙනා
පුංචි පුංචි නුවණිනා
පුංචි ළමෝ පඬි වෙනා

මේ පුංචි පැළෑටිය මරණාසන්නව තිබියදී බේරා ගෙන වර්ධනයට රුකුල් දෙන ලද්දේ ජයසේකර මහතා විසිනි. මේ පිළිබඳ පහත සඳහන් පුවත මා මෙතෙක් කිසිවෙකුට කියා හෝ කිසි තැනක ලියා නැත. ඊට හේතුව ටිකක්

එය මගේ තරමට වැඩි කතාවක් යැයි තව මත් සිතෙන බැවිනි. එය කවදා හෝ කිය යුත්තක් නිසා මෙහි සඳහන් කරමි.

කෘෂිකර්මයට, කර්මාන්තයට හෝ මොන ම කලා ශිල්පයකට වත් දක්ෂකමක් මා තුළ නොමැත. එක්තරා අන්දමකට පන්තියෙන් කොන් වී සිටින මම ද සෙසු ළමයින් සමග පන්තියට පැමිණෙමි. කලින් දින බාර දුන් අපේ රචනා සහිත පොතුත් රැගෙන ගුරුතුමා පන්තියට පැමිණෙයි. හරි බරි ගැහී වාඩි වෙන ඔහු එහි උඩින් ම ඇති රචනා පොත ගෙන රැල් බුරුල් අරියි. ඒ මගේ පොතයි. මම සිහින් බියකින් වෙළී යමි.

ඔහු ඒ රචනය කියවන්නේ හොඳ නිසා ද? දුර්වල නිසා ද? ඔහුගේ මුහුණේ පවතින්නේ ප්‍රීතියක් මිස කෝපයක් නොවේ. රචනයේ කිසියම් තැනක එන අදහසක් අවධාරණය කරන ඔහුට 'වෙරි ගුඩ් අයිඩියා' යැයි ඉබේට ම කියවෙයි. සිංහල පුහුණු ගුරුවරයකු වෙතත් ඔහුට බලවත් සතුටක් ඇති වූ අවස්ථාවල මෙසේ ඉංග්‍රීසි වාක්‍යාංශයක් හෝ වචනයක් කියවෙයි.

'මෙන්න මේ වගේ තමයි වාක්‍ය රචනා ලියන්න ඕනෑ' ජයසේකර මහතා පන්තියේ මුල්ලක ගුලි වී එහෙත් සතුටින් පිම්බී සිටින මා දෙස බලා පවසයි. ඉන් පසු මා පන්තියේ ඉදිරියට කැඳවා කියන පුරාවෘත්තයක් ඇත.

'සර් ඩී. බී. ජයතිලක උන්නැහෙ බොහොම අමාරුවෙන් ඉගෙන ගත්තු කෙනෙක්. පුංචි කාලෙ උන්නැහෙගෙ නම බාරොන්. බාරොන් ඉගෙන ගත්තෙ විද්‍යාලංකාර පිරිවෙනේ අධිපති රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක හාමුදුරුවන්ගෙන්. බාරොන් පාඩම් දෙන කොට හාමුදුරුවෝ නිතර කියපු දෙයක් තමයි 'බාරාත් කවදා හරි මිනිහෙක් වෙයි' කියන එක. ඔහු පුංචි මගේ සිරුරේ උඩ සිට පහළට ඇස් දුවවා හිස සලයි. 'ඒ වගේ අපේ මේ බාරාත් කවදා හරි මිනිහෙක් වෙයි.'

ඔහු මෙය විටක් දෙකක් පමණක් නොව බොහෝ වාර ගණනක් පවසා ඇත. ඒ වනාහි අම්මාගෙන් පමණක් දිය බිඳක් ලබමින් තිබූ ඉහත කී පැළෑටියට ලැබුණු ජලධාරාවක් විය.

ජයසේකර මහතාගේ ප්‍රශංසා හේතු කොට ගෙන පන්තියේ කිසිවෙක් මට ඊර්ෂ්‍යා කෙළේ නැත. එක්කෝ ඔවුන් එහි නියම ගැඹුර නොහඟින්නට ඇත. නැත්නම් මා වැනි කෙනෙකුට ඉන් ඇති වන යහපතක් නැතැයි සිතන්නට ඇත. වෙනෙකක් තබා ඔවුන් මට වඩා හොඳින් ලියන්නට පුළුවන්යැයි සැලකුයේ වෙනත් ළමයකුට ය! ඔහු සාමාන්‍යයෙන් හැම වැඩකට ම දක්ෂකමක් පෙන්වූ ඩයස් පවුලේ සාමාජිකයෙක් විය. ඔහු බොහෝ කාලයක් මෝටර් රථ සේවා ස්ථානයක සේවය කරමින් සිට පසුව ගුරුවරයෙක් විය.

මෙයින් වැඩක් විනා අවැඩක් සිදු වූයේ නැත. වටේ ඉන්නන් ගැන නොතකා කෘතිය කෙරේ විශ්වාසය කෙමෙන් දියුණු කර ගැනීමට මට ඉන් ඉඩ ප්‍රස්තාව සැලසුණි. පහළ මධ්‍යම ගණයේ බාල සිසුන් දෙස බැලූ උපේක්ෂාවෙන් ම මට ඔවුන් දෙස ද බැලීමට බැරිකමක් නැත."

සාහිත්‍ය නිර්මාණයෙහිලා සිය සිසු දරුවන් තුළ නිර්මාණාවේශයත්, උද්‍යෝගයත් දිරියත් දැල්වූ ජයසේකර මහතා බඳු ගුරුපියවරු, ගුරු මව්වරු සදා ගෞරවයට පාත්‍ර විය යුත්තෝ ම ය. මන්ද යත්, ඒ පුංචි පැළ පොඩි දලු ලනු දැක ඊට නිසි දිය පොහොර ලා සරු පසක් තනනුයේ ඔවුන්ගේ ඇගයුම්, අනදැනුම්, මග පෙන්වීම් අනුව වන හෙයිනි. පාසල් වියේ දී ම අප තුළ දැල්වෙන නිසග ප්‍රතිභානයක් නිවැරදි ව හඳුනා ගන්නෝ ද ඔවුහු ම ය. එහෙයින් මෙබඳු සුපසන් වියත් දිවි මං තනාලන්නෝ ද ඔවුහු ම ය.

කේ. ජයතිලක වැනි කෘතහස්ත ලේඛකයෙකු සිය ජීවන අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් ලියා තැබූ නවකතා, කෙටිකතා සහ විචාර පත පොත අද අපගේ සම්භාවනාවට පාත්‍ර වනුයේ ම යට කී ළමා වයසේ පටන් ඔහුගේ චරිතය තුළ වැඩුණු, සැඟවුණු නැවත මතු වූ යම් යම් සිතුවිලි සංකල්පනා හෙවත් පරිකල්පනයන්ගේ අපූර්වත්වය නිසා ය. ලොව පුරා ජීවමාන එබඳු නිර්මාණශීලී ලේඛකයන්ගේ චරිතාපදාන කියවීමෙන් ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ නිර්මාණයන්වලින් මතු වන ඒ ඒ අව්‍යාජ හැඟීම්, දැනීම්, විඳීම් සේ ම ඔවුන්ගේ දිවි පැවැත්ම හා ජීවන දර්ශනය අපට ද පසක් කර ගත හැකි නම් අපගේ නිර්මාණශීලීත්වයත්, රසඥතාව සහ ජීවිත පරිඥානයත් වඩාලීමට එය ම ඉවහල් වන්නේ ය.

## අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| ස්වයං චරිතාපදානය | - | තමාගේ ම ජීවිත කතාව |
| අන්‍යතර | - | වෙනත් |
| පුරාවෘත්තය | - | අතීත කතා පුවත |
| ජීවිත පරිඥානය | - | ජීවිතාවබෝධය |
| බහුශ්‍රැත | - | බොහෝ ඇසූ පිරූ තැන් ඇති |
| අවදානම් | - | අනතුරුදායක |
| ස්මරණ ශක්තිය | - | මතක ශක්තිය/ ධාරණ ශක්තිය |
| වලයාකාර | - | වළල්ලක ආකාරයට |
| දුඹුල් | - | අපැහැදිලි |

## අවබෝධය

1. මේ ලේඛකයාගේ උපන් ගම හා උගත් පාසැල කුමක් ද?
2. කේ. ජයතිලකයන්ගේ ළමා වියේ අත්දැකීමක් කෙටියෙන් විස්තර කරන්න.
3. ජයතිලක ශිෂ්‍යයාගේ දක්ෂතා හඳුනා ගත් ගුරුතුමා කවරෙක් ද? ඉන් මේ ශිෂ්‍යයාට අත් වූ ප්‍රතිඵල කවරේ ද?
4. මෙම පාඩමේ දැක්වෙන ප්‍රසිද්ධ ලේඛකයන් දෙදෙනකු නම් කරන්න.
5. පාඩමේ සඳහන් ආකාරයට මෙම ලේඛකයා කියවූ පැරණි සිංහල පොත් මොනවා ද?

## ලිඛිත අභ්‍යාස

1. **පහත දැක්වෙන වාක්‍යයන්හි අදහස සැකෙවින් ලියන්න.**

   i. 'පුංචි පැළෑටිය මරණාසන්න ව තිබියදී බේරා ගෙන වර්ධනයට රුකුල් දෙන ලද්දේ ජයසේකර මහතා විසිනි.'
   ii. 'ඒ වනාහි අම්මාගෙන් පමණක් දිය බිඳක් ලබමින් තිබූ ඉහත කී පැළෑටියට ලැබුණු ජල ධාරාවක් වේ.'
   iii. 'අපි ගුරුවරයා වටා වලයාකාරව සිට ගෙන කවි හා කතාන්දර උගනිමු.'
   iv. 'හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ.'
   v. 'පුංචි පුංචි නුවණිනා - පුංචි ළමෝ පඬි වෙනා.'

3. **මේ පදවල අර්ථය දෙන වෙනත් පද (සමානාර්ථ පද) ලියන්න.**

   i. මතකය - ...........................
   ii. පුෂ්ප - ...........................
   iii. පාඨශාලාව - ...........................
   iv. ග්‍රාමීය - ...........................
   v. රුචිය - ...........................

4. **කෙටි පිළිතුරු සපයන්න.**

   i. කේ. ජයතිලක සමගම එක පන්තියේ උගත් මහගම සේකර ප්‍රකට වූයේ කුමක් නිසා ද?
   ii. දෙස් - විදෙස්හි ශ්‍රේෂ්ඨ ලේඛකයන් ලියූ වෙනත් ස්වයං චරිතාපදාන කෘති නම් කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

iii. මාර්ටින් වික්‍රමසිංහගේ ළමා කාලය ගැන ඔබ අසා ඇති තොරතුරු මොනවා ද?

iv. පාසැලේ දී මතු වූ ඔබ සතු සහජ කුසලතා හෝ සුවිශේෂ හැකියාවන් කවරේ ද? ඒ සඳහා ඔබ ලත් දිරි ගැන්වීම් හෝ ඇගයුම් මොනවා ද?

v. ඔබේ දෙමවුපියන්, වැඩිහිටියන් සහ ගුරුවරුන් කෙරෙන් ඔබ අසා ඇති ප්‍රශංසාත්මක වදන් හෝ ඔවදන් මොනවා ද? ඒවා ඔබේ චරිතයේ හැඩගැස්මට කෙසේ බල පානු ඇත් ද?

5. **'මගේ ළමා විය' හෝ 'මගේ පාසල් ජීවිතය' යන මැයෙන් ඔබේ ම අත්දැකීම් සහිත කෙටි රචනයක් ලියන්න.**

## ප්‍රායෝගික අභ්‍යාස

1. **කණ්ඩායම් වශයෙන් බෙදී පහත සඳහන් විශිෂ්ට ගණයේ පුද්ගලයන්ගේ ජීවන අත්දැකීම් සහ විශේෂ තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.**

   මාර්ටින් වික්‍රමසිංහ
   රවීන්ද්‍රනාත් තාගෝර්
   මක්සිම් ගෝර්කි
   ජී. බී. සේනානායක
   මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

2. **කේ. ජයතිලකගේ කෘති නාමාවලියක් පිළියෙල කරන්න.**
3. **ඔබ සිත් ගත් කේ. ජයතිලක කෘතිය පිළිබඳ රචනාවක් ලියන්න.**